# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2164/57 - 2020 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා - 2020.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම.

*මගේ අංකය* : DS/VN/L.A.A/VITHTHAGAPURAM.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/5/2018/HA/15.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

| | |
|---|---|
| පළාත | : උතුර; |
| දිස්ත්‍රික්කය | : යාපනය; |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ; |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : විත්තගපුරම් (J/223); |
| ගම | : තෙල්ලිප්පළේ නිරිත; |
| මූලික පිඹුර අංකය | : පීපීයා 2921; |
| හේතුව | : විත්තගපුරම් ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරි කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා (J/223) (ග්‍රාම ලේකම් කාර්යාලය); |

කැබලි අංක 01

ඉඩමේ නම: නීලාවත්තයි හා කඩ්ඩුක්කුම්පලයි; විස්තරය: වත්තේ ස්ථිර ගොඩනැගිල්ලක්, නළ ළිඳක්, වැසිකිලිවල, පොල් ගස් දෙකක් (අවුරුදු 10-15), මාර්ගෝසා ගස් දෙකක් (අවුරුදු 5-10) හා තේක්ක ගසක් (අවුරුදු 5-10); හිමිකම් කියන අය: වයිද්දීස්වරන් කුණාලන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0312.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 අප්‍රේල් මස 30 වැනි දින පෙ. ව. 10.00 ට තෙල්ලිප්පළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2020 අප්‍රේල් මස 15 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ස. සිවශ්‍රී,
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ.

2020 පෙබරවාරි මස 20 වැනි දින,
වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 532

1A - G 32116 - 17 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගතකළ හැක.*